| ආයතනවල සාමාන්‍ය ශේෂ ගිණුම | 23 | (14,382,296) | (12,535,924) | (7,411,260) | (6,612,984) |
| මුළු දළ වත්කම්/සම කොටස් | | | (12,535,924) | | (6,612,984) |

සැලකිය යුතුය : මෙම වටිනාකම් ආසන්න රුපියලට වැටයීම සිදු කර ඇත.

මෙම මූල්‍ය වාර්තා සම්පාදනය කිරීමෙහි සහ ඉදිරිපත් කිරීමෙහි ලා මෙම ආයතනයෙහි කළමනාකරණ මණ්ඩලය වග කියනු ලබන අතර, එම මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් මෙම මූල්‍ය වාර්තාවලට අත්සන් තබා ඇත.

මෙම මූල්‍ය වාර්තා, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ ව්‍යවස්ථාපිත විධිවිධාන හා අනුකූල වේ.

මහාචාර්ය පූජ්‍ය කොටපිටියේ රාහුල හිමි
අධ්‍යක්ෂ
පාලි හා බෞද්ධ අධ්‍යයන
පශ්චාත් උපාධි ආයතනය

පූජ්‍ය මිරිස්වත්තේ විමලඥාන
කළමනාකරණ මණ්ඩල සාමාජික
පාලි හා බෞද්ධ අධ්‍යයන
පශ්චාත් උපාධි ආයතනය

ඒ.පී.එස්.එම්. දොලගේ මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත්
උපාධි ආයතනය

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

කැලණිය විශ්වවිද්‍යාලය

**2015 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන වාර්තාව**

| | සටහන් | 2015 | | 2014 | |
|---|---|---|---|---|---|
| ආදායම් | | රු. | රු. | රු. | රු. |
| රජයේ ආදායම් - පුනරාවර්තන | | 12,000,000 | | 24,150,000 | |
| වෙනත් ආදායම් | | | | | |
| ණය පොලී | | 156,796 | | 136,078 | |
| පැරණි ගබඩා විකුණුම් | | - | | - | |
| විවිධ ලැබීම් | 24 | 1,251,376 | | 804,449 | |
| ලියාපදිංචි කිරීමේ ගාස්තු | | 641,000 | | 678,500 | |
| පංති ගාස්තු | | 24,621,393 | | 19,785,908 | |
| විභාග ගාස්තු | | 101,500 | | 125,000 | |
| පුස්තකාල ගාස්තු | | 426,000 | | 441,000 | |
| ප්‍රකාශන අලෙවිය | | 9,910 | | 7,670 | |
| පැරණි ගබඩා/බැහැර කළ ද්‍රව්‍ය විකුණුම් | | - | | - | |
| පුස්තකාල දඩ ගාස්තු | | 7,147 | | 4,665 | |
| දීර්ඝ කළ ව්‍යාපෘති ආදායම් | | 12,708,874 | | 5,655,000 | |
| ක්‍රමක්ෂය | 25 | 4,244,470 | | 1,407,787 | |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 25 | 1134633 | | 1063721 | |
| මුළු ආදායම | | | 57,303,098 | | 54,259,778 |
| **වියදම්** | | | | | |
| පෞද්ගලික වෙතන – අධ්‍යයන | 25 | 16,320,780 | | 11,751,294 | |
| පෞද්ගලික වෙතන – අනධ්‍යයන | 25 | 16,136,820 | | 15,599,966 | |
| ගමනාගමන | | 159,438 | | 162,293 | |
| සැපයුම් | | 1,474,586 | | 2,466,255 | |
| නඩත්තු | | 888,180 | | 1,052,452 | |
| කොන්ත්‍රාත් සේවා | | 13,407,246 | | 13,105,701 | |
| ක්ෂයවීම් සහ වෙනත් මෙහෙයුම් වියදම් | | 4,330,877 | | 3,356,267 | |
| වෙනත් වියදම් | | 11,556,206 | | 7,547,221 | |
| මුළු වියදම් | | | 64,274,134 | | 55,041,448 |
| මෙහෙයුම් කටයුතුවලින් අතිරික්තය/(හිඟය) | | | (6,971,036) | | (781,671) |
| **මූල්‍ය පිරිවැය** | | | | | |
| දේපල, යන්ත්‍ර සූත්‍ර සහ ආම්පන්න විකුණුම් මත ලැබීම් | | | - | | |
| මෙහෙයුම් නොවන මුළු ආදායම (වියදම්) | | | (6,971,036) | | (781,671) |
| අතිවිශේෂ කටයුතුවල අතිරික්තය/(හිඟය) | | | | | |
| අතිවිශේෂ කටයුතු | | | - | | - |
| කාල සීමාව සඳහා අතිරික්තය/(හිඟය) | | | - | | - |
| | | | (6,971,036) | | (781,671) |

සැලකිය යුතුය : මෙම වටිනාකම් ආසන්න රුපියලට වැටයීම සිදු කර ඇත.

මෙම මූල්‍ය වාර්තා සම්පාදනය කිරීමෙහි
සහ ඉදිරිපත් කිරීමෙහි ලා මෙම ආයතනයෙහි
කලමනාකරණ මණ්ඩලය වග කියනු ලබන අතර,
එම මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් මෙම මූල්‍ය වාර්තාවලට අත්සන් තබා ඇත.

මෙම මූල්‍ය වාර්තා, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ ව්‍යවස්ථාපිත විධිවිධාන හා අනුකූල වේ.

මහාචාර්ය පූජ්‍ය කොටපිටියේ රාහුල හිමි
අධ්‍යක්ෂ
පාලි හා බෞද්ධ අධ්‍යයන
පශ්චාත් උපාධි ආයතනය

පූජ්‍ය මීරිස්වත්තේ විමලඥාණ
කලමනාකරණ මණ්ඩල සාමාජික
පාලි හා බෞද්ධ අධ්‍යයන
පශ්චාත් උපාධි ආයතනය

ඒ.පී.එස්.එම්. දොලගේ මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත්
උපාධි ආයතනය

**<u>පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය</u>**

**<u>කැලණිය විශ්වවිද්‍යාලය</u>**

**<u>2015 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ වාර්තාව</u>**

| | 2015 | | 2014 | |
|---|---|---|---|---|
| <u>මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහ</u> | රු. | රු. | රු. | රු. |
| වර්ෂය සඳහා අතිරික්තය/(හිගය) | | (6,971,036) | | (781,671) |
| <u>මුදල් ප්‍රවාහ ඇතුලත් නොවන කටයුතු සඳහා ගැලපීම්</u> | | - | | - |
| පාරිතෝෂිත | | 1,146,237 | | 2,804,198 |
| ක්ෂයවීම් | | 4,244,470 | | 3,260,130 |
| වෙනත් මෙහෙයුම් වියදම් | | 86,408 | | |
| වෙනත් මෙහෙයුම් ආදායම් | | (1,134,633) | | |
| ක්‍රමක්ෂය | | <u>(4,244,470)</u> | | <u>(1,407,787)</u> |
| | | (6,873,025) | | 3,874,870 |
| පූර්ව කාලසීමා කටයුතු | | - | | - |
| කාරක ප්‍රාග්ධන කටයුතුවල වෙනස්වීම්වලට ප්‍රථම මෙහෙයුම් අතිරික්තය | | (6,873,025) | | (3,874,870) |
| <u>කාරක ප්‍රාග්ධන කටයුතුවල වෙනස්වීම්</u> | | | | |
| ගබඩා අත්තිකාරම්හි හා පර්යේෂණ සහ ප්‍රකාශන තොගවල පහළ යාම/(ඉහළ යාම) පහළ යාම | 23,371 | | 2,080 | |
| සුළු ණයගැතියන්ගේ පහළ යාම/(ඉහළ යාම) | (109,326) | | (104,014) | |
| කාර්ය මණ්ඩල අත්තිකාරම්හි පහළ යාම/(ඉහළ යාම) | 92,760 | | (1,326,125) | |
| සේවා සහ සැපයුම් අත්තිකාරම්හි පහළ යාම/(ඉහළ යාම) | 45,875 | | (45,873) | |
| අත්තිකාරම් ගෙවීමෙහි පහළ යාම/(ඉහළ යාම) පහළ යාම | 726,691 | | 16,575 | |
| වෙනත් තැන්පතුවල පහළ යාම/(ඉහළ යාම) | - | | 4,587,500 | |
| ලැබිය හැකි ආයෝජන මත පොලියෙහි පහළ යාම/(ඉහළ යාම) | - | | - | |
| තැන්පතු සහ සුළු ණයහිමියන්ගේ ඉහළ යාම (පහළයාම) | 361,904 | | (4,000) | |
| උපචිත වියදම් සහ අනෙකුත් වගකීම්හි ඉහළ යාම (පහළයාම) | 336,994 | <u>1,478,270</u> | 80,232 | <u>3,206,374</u> |
| **මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ දළ මුදල් ප්‍රමාණය** | | **(5,394,756)** | | **7,081,244** |
| <u>ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ</u> | | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | (3,370,723) | | (3,675,143) | |
| වෙනත් ආයෝජන | <u>(3,787,302)</u> | | <u>(591,412)</u> | |
| ආයෝජන කටයුතු සඳහා භාවිත කළ දළ මුදල් | | **(7,158,025)** | | **(4,266,555)** |
| <u>මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ</u> | | | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන | 2,750,000 | | 2,000,000 | |
| ප්‍රාග්ධන වියදම් සඳහා දීර්ඝ කළ ව්‍යාපෘති අරමුදල් | 1,112,293 | | - | |
| වෙනත් අරමුදල් | <u>3,869,790</u> | | <u>1,403,774</u> | |
| මූල්‍ය කටයුතුවලින් ජනනය වූ මුදල් | | <u>7,732,083</u> | | <u>3,403,774</u> |
| **මුදල් සහ සම මුදල්හි දළ ඉහළයාම** | | **(4,820,698)** | | **6,218,463** |
| වසර මුලදී මුදල් සහ සම මුදල්හි ශේෂය | | <u>12,832,901</u> | | <u>6,614,438</u> |
| වසර අගදී මුදල් සහ සම මුදල්හි ශේෂය (සටහන 1) | | **8,012,202**<br>======= | | **12,832,901**<br>======= |

| <u>සටහන 1</u> | | <u>2015</u> | | <u>2014</u> |
|---|---|---|---|---|
| | | රු. | | රු. |
| බැංකු ශේෂය | | 8,012,202 | | 12,832,901 |
| අනෙක් බැංකු ශේෂය | | - | | - |
| | | 8,012,202<br>======= | | 12,832,901<br>======= |

__පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය__
__කැලණිය විශ්වවිද්‍යාලය__
__**2015 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා දළ වත්කම්/සම කොටස්හි වෙනස්ක**__
__පිළිබඳ වාර්තාව__

| | ආයතනයෙහි සාමාන්‍ය සංචිතය රු. | පිළිඇගයීම් ශේෂ ගිණුම රු. | මුළු වටිනාකම රු. |
|---|---|---|---|
| **2013-01-01 දිනට ශේෂය** | (3,799,915) | 798,276 | (3,001,638) |
| 2013 වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය) | (3,467,632) | - | (3,467,632) |
| **2014-01-01 දිනට ශේෂය** | (7,267,547) | 798,276 | **(6,469,270)** |
| | | | |
| බැහැර කළ පරිත්‍යාග අයිතමයන්හි මාරු කළ අගය | 637,957 | | 637,957 |
| 2014 වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය) | (781,671) | - | (781,671) |
| **2015-01-01 දිනට ශේෂය** | (7,411,260) | 798,276 | **(6,612,984)** |
| | | | |
| බැහැර කළ පරිත්‍යාග අයිතමයන්හි මාරු කළ අගය | - | | - |
| 2015 වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය) | (6,971,036) | 1,048,095 | (5,922,941) |
| **2015-12-31 දිනට ශේෂය** | (14,382,297) | 1,846,372 | **(12,535,925)** |

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### 1. සාමාන්‍ය ප්‍රතිපත්ති

### 1.1. ප්‍රධාන කටයුතු සහ සුදානම් වීමේ ස්වභාවය

මෙම ආයතනය විසින් පාලි හා බෞද්ධ අධ්‍යයනය සඳහා විශේෂඥතාවක් දක්වනු ලබන සිසුන් වෙත පශ්චාත් උපාධි උපදෙස්, පුහුණුව සහ පර්යේෂණ ලබා දෙන අතර, උපාධි සහ ඩිප්ලෝමා පිරිනමනු ලබයි.

### 1.2. සුදානම් වීමේ පදනම

මෙම මූල්‍ය වාර්තා, මූල්‍ය තත්ත්ව වාර්තා, මූල්‍ය කාර්යසාධන වාර්තාව, දළ වත්කම් සහ සම කොටස්හි වෙනස්කම් වාර්තාව, මූල්‍ය ප්‍රවාහ වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින් සමන්විත වේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන් විසින් නිකුත් කරන ලදුව, සිය මූල්‍ය චක්‍රලේඛ ලිපි අංක 03/2011 මඟින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාල කර ගනු ලැබ ඇති, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුව, ආයතනයෙහි මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලැබ ඇත.

### 2. සුවිශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1. දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න

ලී බඩු සහ මෙවලම්, කාර්යාලයීය උපකරණ, ඉගැන්වීමේ උපකරණ, පුස්තකාල පොත් සහ කාලීන සඟරා, මෝටර් රථ සහ වෙනත් වත්කම් සහ රජයේ ප්‍රදාන මඟින් ලබාගෙන ඇති භාණ්ඩ, අභ්‍යන්තරිකව ජනනය වූ මුදල් සහ පරිත්‍යාග.

#### (අ) හඳුනාගැනීමේ පදනම

දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න හඳුනාගත හැකි වනුයේ, මෙම අයිතම හා බැඳි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා යනු ලැබුවහොත් සහ එම අයිතමවල පිරිවැය හැකිතාක් දුරට ගණනය කරනු ලැබිය හැකි සම්භාවිතාවක් ඇත්නම් පමණි.

අවුරුදු 5 සිට 10 දක්වා පරාසයක් තුල දිවෙන ආර්ථික කාලසීමාවක් සහිත එක් එක් ප්‍රභේද 5ක් තුල, එම අදාළ ප්‍රභේදය මත වත්කමක ආයු කාලය රඳා පවතී.

(ආ) ස්ථාවර වත්කම් නැවත තක්සේරු කිරීම

රක්ෂණාවරණ අරමුණු උදෙසා, තක්සේරුකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරු විසින් මෙම ආයතනය සතු අංක53-3103 දරන මෝටර් රථය, 2015.02.11 දිනට රු. 1,150,000/- ක් සඳහා නැවත තක්සේරු කරනු ලැබ ඇත.

(ඇ) ක්ෂයවීම්

දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න භාවිතය සඳහා යොදා ගනු ලබන දින සිට ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය අනුවසෘජු රේඛීය ක්‍රමවේදය මත, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුල ක්ෂයවීම් හඳුනා ගනු ලැබේ.

වත්කම්හි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය පහත සඳහන් පරිදි වේ :

| වත්කම | ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය |
|---|---|
| ලී බඩු සහ මෙවලම් | අවුරුදු 10 |
| විද්‍යාගාර සහ ඉගැන්වීමේ උපකරණ | අවුරුදු 05 |
| කාර්යාලයීය උපකරණ | අවුරුදු 05 |
| පුස්තකාල පොත් සහ කාලීන සඟරා | අවුරුදු 05 |
| මෝටර් රථ | අවුරුදු 05 |

3. ජංගම වත්කම්

ශේෂ පත්‍රයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇත්තේ, මූල්‍ය ප්‍රකාශන දිනයේ සිට එක් වසරක් තුල නැවත අය කර ගනු ලැබිය හැකි වත්කම්ය.

3.1. භාණ්ඩ ලේඛන සහ තොග

ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කළ පදනම මත, භාණ්ඩ ලේඛනවල පිරිවැය නිර්ණය කරනු ලැබ ඇති අතර, ඊට එම භාණ්ඩ ලබාගැනීමේදී දැරීමට සිදු වූ වියදම් සහ ඒවා පැවති තත්ත්වයට සහ ස්ථානයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය ඇතුලත් වේ.

4. **ජංගම වගකීම්**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇති වගකීම් වනුයේ, මූල්‍ය ප්‍රකාශන දිනයේ සිට එක් වසරක් තුළ ගෙවනු ලැබිය යුතු වගකීම්ය. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, දත් සියලුම වගකීම් ගණනය කරනු ලැබ ඇත.

5. **පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම්**

සියලුම සේවකයින් එම වසර තුළදීම විශ්‍රාම ගනු ලබන්නේ නම් ගෙවනු ලැබිය හැකි මුදල් ප්‍රමාණය පිළිබඳව පූර්ව නිගමනය කරමින්, 1983 අංක 12 දරන පාරිතෝෂිත පනත යටතේ විශ්‍රාම ගනු ලබන පුද්ගලයින් වෙත ගෙවනු ලැබිය හැකි පාරිතෝෂිත සඳහා මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රතිපාදන වෙන්කිරීම් සිදු කරනු ලැබ ඇත.

6. **පොලී ආදායම**

කාලසීමාව සඳහා ලද සහ ලැබීමට නියමිත පොලී ආදායම, බාහිරව සීමා කරනු ලැබූ පරිත්‍යාග මත උපයන ලද ආයෝජන ආදායම් හැර, ලද ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ වාර්තා කෙරෙනු ලැබේ. එවැනි අරමුදල් මත හිඟ පොලී ආදායම්, එම වර්ෂය තුළ සෘජු අරමුදල් ඉහළ යාමක් ලෙස වාර්තා කෙරෙනු ලැබේ.

7. **වියදම් හඳුනාගැනීම**

අධ්‍යාපන සහ පර්යේෂණ හා සම්බන්ධ සියලුම වියදම්, උපචිත වියදම් ලෙස වාර්තා කෙරෙනු ලබන අතර, ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කරගැනීමේදී හෝ වැඩිදියුණුකිරීමේදී පැන නැඟිනු ලබන සියලුම වියදම්, ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

8. **විදේශ විනිමය**

තැන්පතු සිදු කරනු ලබන දිනයේදී පවතින විනිමය අනුපාතයට අනුව විදේශ විනිමය තුළ සිදු කෙරෙනු ලබන ගණුදෙණු වාර්තාගත කෙරෙනු ලැබේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය
எனது இல.
My No.
} එච්ඒ/ඊ/පීඅයිපීබීඑස්/1/15/38

ඔබේ අංකය
உமது இல.
Your No.
}

දිනය
திகதி
Date
} 2016 ඔක්තෝබර් /7 දින

පාලන
24 OCT 2016
කැලණිය

අධ්‍යක්ෂ,

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.

**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

පිටපත් :-

1. ලේකම් , උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
2. ලේකම් , මුදල් අමාත්‍යාංශය
3. උපකුලපති , කැලණිය විශ්වවිද්‍යාලය
4. සභාපති , විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊඑච්ඩී/ඊ/පීඅයිපීබීඑස්/1/15/38 ඔබේ අංකය / உமது இல. / Your No. }  දිනය / திகதி / Date } 2016 ඔක්තෝබර් 7 දින

අධ්‍යක්ෂ,

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.

**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 23 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත 2016 අගෝස්තු 02 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා, නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වැනි වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව පරිත්‍යාග වත්කම්, ක්‍රමක්ෂය කළ යුතු වුවත් 2012 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබූ වටිනාකම රු.9,100,000 ක් වූ වෑන් රථයක් නියමිත පරිදි ක්ෂය කර තිබුණු නමුත් ක්‍රමක්ෂය කිරීම 2015 වර්ෂයට පමණක් සිදු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට වත්කමේ ධාරණ අගය රු.2,123,334 ක් වුවද එය නියෝජනය වූ පරිත්‍යාග ගිණුමේ ශේෂය රු.7,280,000 ක් ව පැවතුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

ස්ථාවර තැන්පතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු පොලී රු.44,824 ක් ගිණුම් ගත කර නොතිබුණි.

2.2.3 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශන අනුව කාර්යාල හා ලී බඩු උපකරණ සහ පොත් පත් සහරා වල වටිනාකම සහ ස්ථාවර වත්කම් ලේඛණය අතර රු.2,896,803 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 757(2) අ | සමාලෝචිත වර්ෂයේදී සිදු කරන ලද පුස්තකාල පොත් සමීක්ෂණයේ වාර්තා 2016 ජුනි 30 වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයෙහි XX වන පරිච්ඡේදයේ 3(1) වගන්තිය සහ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සහ නිවාඩු සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වැටුප් හා දීමනා ලෙස රු.14,347,377 ක් ගෙවා තිබුණි. |
| (ඇ) 1994 ජුනි 14 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 95 | 2014 මාර්තු 26 දිනැති අංක 06/2014 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ ලිපියට අනුව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සංග්‍රහ වියදම් ප්‍රතිපූර්ණය කිරීම වෙනුවට වැටුප් මත සංග්‍රහ වියදම් දීමනා ලෙස රු.178,955 ක මුදලක් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,971,036 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.781,671 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.6,189,365 කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.3,043,320 ක් වැඩි වී තිබුණද සේවක පාරිශ්‍රමික රු.5,106,340 කින් හා වෙනත් වියදම් රු.4,008,985 කින් වැඩිවීම ඉහත ඌනතාවයන් වැඩිවීම කෙරෙහි විශේෂයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේදී ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තයක් පැවති නමුත් එය ඉන් පසුව අඛණ්ඩව හා ක්‍රමිකව වර්ධනය වන ඌනතාවයක් බවට පත් වී තිබුණි. කෙසේවුවද සේවක පාරිශ්‍රමික ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය ගැලපීමෙන් පසු දායකත්වය ධන අගයක් ගෙන තිබූ අතර එය සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.29,817,441 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

ශිෂ්‍යයන් ඇතුළත් කර පාලි හා බෞද්ධ විෂය ක්ෂේත්‍ර පිළිබඳ පශ්චාත් උපාධි තත්ත්වයේ ඉගැන්වීම, පුහුණු වීම සහ පර්යේෂණ කිරීම සඳහා කටයුතු සැලැස්වීම, පශ්චාත් උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා නිශ්චය කිරීම සහ ප්‍රදානය කිරීමට සුදුසුකම් ලැබූ තැනැත්තන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම සහ තනතුරු ඇති කිරීම, අත්හිටු වීම හෝ නැති කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණු විය.

කාර්ය සාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්මට අනුව ආයතනය විසින් 2015 වර්ෂය සඳහා ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු 26 ක් සහිතව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණු අතර එම අරමුණුවලින් 18 ක් වර්ෂය තුළ සම්පූර්ණයෙන් නිම කර ගැනීමට හැකිව තිබුණි. දැනට ක්‍රියාකාරකම් 05 ක් නිම වෙමින් පැවති අතර ක්‍රියාකාරකම් 03 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. කෙසේ වුවද, මෙම ක්‍රියාකාරී සැලැස්ම තුළින් ළඟාකර ගැනීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් සඳහා භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳව තොරතුරු දක්වා නොතිබුණි.

(ආ) අධ්‍යයන කාර්ය සාධනය පිළිබඳව සලකා බැලීමේදී ආයතනය විසින් පවත්වන ලද පාඨමාලා 07 කට අදාළව වර්ෂ 03 ක සාරාංශගත තොරතුරු පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පසුගිය වර්ෂ දෙක හා සසඳන විට සමස්ත ශිෂ්‍ය ලියාපදිංචියේ සැලකිය යුතු අඩු වීමක් පෙන්නුම් නොකෙරුණු අතර ශිෂ්‍ය ලියාපදිංචිය පාඨමාලා අනුව සසඳන විට බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා වැඩි සිසුන් ප්‍රමාණයක් ලියාපදිංචි වී තිබුණි.

(ii) බෞද්ධ අධ්‍යයන දර්ශනපති උපාධිය (M. Phill) හා බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද (Ph.D) උපාධිය හදාරන ලද 215 ක් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සමාලෝචිත වර්ෂයේදී උපාධිය සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව 06 ක් පමණක් වූ අතර මේ සඳහා අපේක්ෂකයින් බොහොමයක් රැකියා වල නියුතු කාර්ය බහුල පුද්ගලයන් වීම එම තත්ත්වයට හේතු වූ බව ආයතනය විසින් විගණනයට දන්වා තිබුණි.

(ඇ) පර්යේෂණ ආධාර සඳහා වාර්ෂික අයවැය ලේඛණය මගින් රු.650,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණද, වර්ෂය තුළ ආචාර්යවරුන් විසින් පර්යේෂණ ආධාර ඉල්ලුම් කර නොතිබුණි. වර්ෂය තුළ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 06 දෙනෙකු සඳහා රු.1,341,406 ක් පර්යේෂණ දීමනා වශයෙන් ගෙවා තිබූ අතර පර්යේෂණ පරිසංවාදයන් පවත්වා නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෙම ආයතනය ආරම්භයේ සිට වසර 37 ක කාලයක් කුලී ගොඩනැගිලි වල පවත්වාගෙන ගොස් තිබූ අතර ආයතනයට ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අවධානය යොමු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි කුලී වශයෙන් රු.8,410,413 ක් ගෙවා තිබුණි.

(ආ) පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන අමතර පාඨමාලා 05 ක් සඳහා ලැබෙන ආදායමෙන් විවිධ රේටයන් මත රු.2,356,049 ක් ආයතනයේ සංවර්ධන අරමුදලට කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත මාරු කර තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වුවද පාඨමාලා ආදායමෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.441,000 ක මුදලක් සේවකයන්ගේ පෞද්ගලික සුබ සාධනය සඳහා වූ සුබ සාධක අරමුදලකට බැර කර තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට ගබඩා අත්තිකාරම් ගිණුමේ ශේෂය හා ගබඩා ලෙජරය අනුව තොග ශේෂය අතර වෙනස රු.69,347 ක් විය. මෙය තොග ගැලපුම් ගිණුමක් ලෙස දිගින් දිගටම ගිණුම්වල පෙන්වා තිබූ අතර විධිමත් අනුමැතීන් මත තොගයට අවශ්‍ය ගැලපුම් කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

------------------------

ආයතනය විසින් 2015 සැප්තැම්බර් 01 දින අන්වේෂණ ශාස්ත්‍රීය සංග්‍රහයේ එක් පිටපතක් සඳහා රු.350.50 ක පිරිවැයක් දරමින් පිටපත් 300 ක් මුද්‍රණය කර තිබුණි. අධ්‍යක්ෂකවරයාගේ අනුමැතිය මත එක් පිටපතක් රු.500 කට අලෙවි කිරීමට කටයුතු කර තිබුණද විගණිත දිනය වූ 2016 මාර්තු 09 දින වන විට අලෙවි වී තිබුණේ පිටපත් 38 ක් පමණි. ඉතිරි ප්‍රකාශන 217 අලෙවි කිරීම සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙලක් යොදා නොතිබුණි.

5. ගිණුම්කටයුතුභාවය හා යහ පාලනය

5.1 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර, සියයට 71 සිට සියයට150 දක්වාද අයවැය ගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 61 සිට සියයට 287 දක්වා ද පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් පැවතීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) ගබඩා පාලනය | - | මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබූ තොග ශේෂයන් හා උපයෝගී ලේඛණ අතර වෙනස්කම් පැවතීම. |
| (ආ) ස්ථාවර වත්කම් පාලනය | - | මූල්‍ය ප්‍රකාශනයේ වටිනාකම හා ස්ථාවර වත්කම් ලේඛනයේ වටිනාකම අතර වෙනස්කම් පැවතීම. |
| | | ස්ථාවර වත්කම් ලේඛණයේ ඇතැම් වත්කම් වල අත්පත් කර ගත් දිනය සටහන් කර නොතිබීම |
| (ඇ) පුස්තකාල පාලනය | - | පුස්තකාල පොත් සමීක්ෂණය කර වාර්තා ඉදිරිපත් කර නොතිබීම. |
| | | ආපසු භාර නොදුන් කල් ඉකුත් වූ පොත් පැවතීම. |
| (ඈ) වාහන පාලනය | - | ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
POSTGRADUATE INSTITUTE OF PALI AND BUDDHIST STUDIES
UNIVERSITY OF KELANIYA - SRI LANKA

No 113, Dutugemunu Street, Kohuwala.
අංක 113, දුටුගැමුණු වීදිය, කොහුවල.

මගේ අංකය :
My No : PIPBS/ST/03/2016-01

ඔබේ අංකය :
Your No :

2016.12.14

ලියාපදිංචි තැපෑල

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72, පොල්දුව පාර,
බත්තරමුල්ල.

ප්‍රිය මහත්මයාණෙනි,

**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

උක්ත කරුණ සම්බන්ධයෙන් විගණකාධිපතිතුමා විසින් එවා තිබූ අංක එච්ඊඩී/ඊ/පීඅයිපීබීඑස්/1/15/38 හා 2016.10.17 වැනි දිනැති ලිපියට අනුව අදාළ පිළිතුරු කෙටුම්පත 2016.11.10 වැනි දින පැවැති 45 වැනි විගණන කමිටුවට ඉදිරිපත් කරන ලදුව කළමනාකාර මණ්ඩලය වෙත නිර්දේශ කරන ලදී. ඒ අනුව 2016.12.09 වැනි දින පැවැති කළමනාකාර මණ්ඩලය විසින් පහත සඳහන් පිළිතුරු විගණකාධිපතිතුමා වෙත යැවීමට අනුමත කරන ලදී.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

2016 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී අදාළ පරිදි ක්‍රමක්ෂය ගිණුම් ගත කරන ලෙස අදාළ නිලධාරින්ට උපදෙස් දෙන ලදී.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

ඔබ විසින් සඳහන් කර ඇති ස්ථාවර තැන්පතු සඳහා 2015.12.31 දිනට බැංකුව විසින් සනාථ කර ඇති ශේෂයන් පමණක් අවසන් ගිණුම් සඳහා ගෙන ඇත.
2016 වර්ෂයේ සිට ලැබිය යුතු ශේෂය පිළිබඳව අදාළ නිවැරදි කිරීම් අනුව ගිණුම් තැබීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

### 2.2.3 නොසැසඳු පාලන ගිණුම

මෙම වෙනස්කම් සඳහා හේතු මේ වන විට බොහෝ දුරට හඳුනාගෙන ඇති අතර ඉදිරියේදී අවශ්‍ය ගැලපීම් සිදු කෙරෙනු ඇත.

## 2.3 නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

(අ) 2015 සිදු කරන ලද පුස්තකාල ග්‍රන්ථ සංගණනයේ සාරාංශගත තොරතුරු වාර්තාවක් 2016.09.30 වැනි දින කැලණිය විශ්වවිද්‍යාලයට යොමු කර ඇත.

(ආ) 2013 වර්ෂයේ පැවැති ව්‍යාපාර පොදු කාරක සභා (COPE) පාර්ලිමේන්තු රැස්වීමේදී ලබා දුන් උපදෙස් පරිදි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආචාර්යවරුන්ගේ පැමිණීම හා දේශන පැවැත්වීම පිළිබඳ සියලු වාර්තා සටහන් තබා ගන්නා ලෙස ඔවුන් වෙත දැනුම් දී ඇත. එසේම පර්යේෂණ ශිෂ්‍යයන් සඳහා ආචාර්යවරුන් වෙන් කොට ඇති දින සහ වේලාවන් මෙන් ම ලබාගත් නිවාඩු සම්බන්ධ අවශ්‍ය තොරතුරුද ආයතනය වෙත ලබා දීමේ වගකීම ද ඔවුන් වෙත අවධාරණය කර ඇත. එබැවින් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා සේවය වෙනත් ක්‍රමවේදයන් අනුව ගණනය කරනු ලැබේ.

(ඇ) 2014.06.30 දින නිකුත් කර ඇති 2014/05 දරණ විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභා මුදල් චක්‍රලේඛය මගින් සංග්‍රහ දීමනාව වැටුප් හා වේතන (PE) යටතේ දක්වා ඇති නිසා ඒ අනුව අයවැය ලේඛනය හා ගිණුම් සකස් කර ඇත.

එසේ වුවද මෙම රු.178,988/- වාර්ෂික අයවැය යටතේ දක්වා තිබුණද ගෙවා ඇත්තේ ආයතනය විසින් උපයාගත් ආදායමින් වන අතර මහා භාණ්ඩාගාරයේ මුදල් මගින් නොවන බව දක්වමි. (2015 වර්ෂය සම්පූර්ණ වැටුප් හා වේතන පිරිවැය වූ රුපියල් මිලියන 32 සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන ඇත්තේ මිලියන 12 ක් පමණි.)

එසේ වුවද, ඔබගේ නිරීක්ෂණ, චක්‍රලේඛය හා අයවැය චක්‍රලේඛය හා තවදුරටත් අධ්‍යයනය කර ඉදිරියේදී අවශ්‍ය සටහන් තැබීමට උපදෙස් දෙන ලදී.

## 4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

### 4.1 කාර්ය සාධනය

(අ) මේ සම්බන්ධයෙන් ආයතනය සෑහීමකට පත් වේ.

ක්‍රියාකාරී සැලැස්ම තුළින් ළඟා කර ගැනීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් සඳහා මූල්‍යමය දායකත්වයන් මෙම වසරේදී ගණනය කිරීමට අපේක්ෂිතය.

ඉදිරියේදී මෙම ප්‍රකාශන අලෙවිය සඳහා ප්‍රචාරාත්මක ක්‍රියා පිළිවෙතක් අනුගමනය කිරීමට අපේක්ෂිතය.

(ආ) (i) මේ වන විට තරඟකාරී ආයතන කිහිපයක මෙම විෂයට අදාළ පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වේ. එසේ වුවද ගුණාත්මක තත්වය හා ප්‍රමිතිය ස්ථාවරව පවත්වා ගැනීම මත ශිෂ්‍ය සංඛ්‍යාව නිශ්චිත අගයක පවත්වා ගැනීමට ආයතනය සමත් වී ඇත. බෞද්ධ අධ්‍යයන ක්ෂෙත්‍රය ප්‍රධාන විෂය ධාරාව වන බැවින් ඒ සඳහා ඉහළ අගයක් ලැබී ඇත.

(ii) දර්ශනපති හා දර්ශන විශාරද උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි බොහෝ අය රැකියාවක නියුතු කාර්ය බහුල අපේක්ෂකයින් බැවින් මෙම තත්වය පෙන්නුම් කරයි.

(ඇ) ඉදිරියේදී පර්යේෂණ පරිසංවාද පැවැත්වීමට කටයුතු කරමින් පවතී.

4.2 <u>කළමනාකරණ ක්‍රියාකාරකම්</u>

(අ) මේ සම්බන්ධයෙන් 2016 අයවැය කථාවේදී රජය විසින් මිලියන 500ක මුදලක් වෙන් කර ඇති අතර උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් හඳුනාගත් සුදුසු ඉඩම මිලදී ගැනීම සඳහා අවශ්‍ය කටයුතු මේ වනවිට සම්පාදනය කරමින් පවතී.

(ආ) බාහිර පාඨමාලා පවත්වා ගෙන යෑමේදී සියලු සේවක භවතුන් සාමූහිකව දායකත්වය ලබා දෙන නමුත් ඒ වෙනුවෙන් ඔවුන් සියලු දෙනාටම අයවැය මගින් ගෙවීම් වෙන් කර නැත. එසේ හෙයින් කළමනාකාර මණ්ඩලයේ අනුමැතිය මත එම මුදල කාර්ය මණ්ඩල සුභසාධනය සඳහා වෙන් කර ඇත.

(ඇ) ඉහත තොගය සඳහා අවශ්‍ය ගැලපීම සටහන් කිරීම සඳහා අවශ්‍ය පියවර දැනටමත් ගෙන ඇත. 2016 අවසන් ගිණුම් සමඟ අදාළ නිවැරදි කිරීම සිදු කරනු ඇත.

4.3 <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්</u>

අන්වේෂණ සඟරාව ලාභ ඉපැයීමේ පරමාර්ථයෙන් නිර්මාණය නොකරනු ලබන අතර පර්යේෂණාත්මක හා විෂයානුබද්ධ දැනුම විද්වතුන්, ශාස්ත්‍රවන්තයින් වෙත සම්ප්‍රේෂණය කිරීම පරමාර්ථය වේ. මෙය ක්‍රමිකව සෙමින් සිදුවන ක්‍රියාවලියක් වන අතර විශ්වවිද්‍යාල පුස්තකාල වෙත සහන මිලකට මේවා ලබා දීමට කටයුතු කිරීමට අපේක්ෂිතය.

5. <u>ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය</u>

5.1 <u>අයවැය ලේඛනමය පාලනය</u>

<u>ආදායම වැඩිවීම</u>

ශිෂ්‍ය ලියාපදිංචිය බලාපොරොත්තු වූ අගයට වඩා ඉහළ අගයක් ගෙන ඇත. හොංකොංහි Buddha Dhamma Center ආයතනය ද පාඨමාලා සඳහා එක් කර ගැනීම නිසා මෙසේ ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ ගොස් ඇත. ඒ අනුව අයවැයගත ආදායමට වඩා සත්‍ය ආදායම ඉහළ ගොස් ඇත.

වියදම් සම්බන්ධයෙන් ද අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස වර්ෂය තුළදී භාවිතා කර ඇති අතර, ඔබ විසින් සඳහන් කර ඇති පරිදි ප්‍රමාණාත්මක විචලනයන් පෙන්වා ඇත්තේ පාලනය කිරීමට අපහසු වූ වියදම් අයිතම කීපයක් සඳහා පමණි.

කෙසේ වුව ද ඉදිරියේ දී ද වියදම් සම්බන්ධයෙන් අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස උපරිම අයුරින් භාවිත කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ඇත.

6. <u>පද්ධති හා පාලනයන්</u>

(අ) ගබඩා පාලනය
ගබඩා ශේෂ වෙනස නිවැරදි කිරීම සඳහා අවශ්‍ය කටයුතු කර ගෙන යනු ඇත.

(ආ) ස්ථාවර වත්කම් පාලනය
ස්ථාවර වත්කම් ලේඛනයේ වෙනස හඳුනාගෙන ඇති අතර ඉදිරියේදී ඒ සඳහා අදාළ පාර්ශ්වයන් මගින් ලබා දෙන තීරණය අනුව ගිණුම් සටහන් තැබීමට නියමිතය.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) මේ සම්බන්ධයෙන් 2016 අයවැය කථාවේදී රජය විසින් මිලියන 500ක මුදලක් වෙන් කර ඇති අතර උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් හඳුනාගත් සුදුසු ඉඩම මිලදී ගැනීම සඳහා අවශ්‍ය කටයුතු මේ වනවිට සම්පාදනය කරමින් පවතී.

(ආ) බාහිර පාඨමාලා පවත්වා ගෙන යෑමේදී සියලු සේවක මහතුන් සාමූහිකව දායකත්වය ලබා දෙන නමුත් ඒ වෙනුවෙන් ඔවුන් සියලු දෙනාටම අයවැය මගින් ගෙවීම වෙන් කර නැත. එසේ හෙයින් කළමනාකාර මණ්ඩලයේ අනුමැතිය මත එම මුදල කාර්ය මණ්ඩල සුභසාධනය සඳහා වෙන් කර ඇත.

(ඇ) ඉහත තොගය සඳහා අවශ්‍ය ගැලපීම සටහන් කිරීම සඳහා අවශ්‍ය පියවර දැනටමත් ගෙන ඇත. 2016 අවසන් ගිණුම් සමඟ අදාළ නිවැරදි කිරීම සිදු කරනු ඇත.

### 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

අන්වේෂණ සඟරාව ලාභ ඉපැයීමේ පරමාර්ථයෙන් නිර්මාණය නොකරනු ලබන අතර පර්යේෂණාත්මක හා විෂයානුබද්ධ දැනුම විද්වතුන්, ශාස්ත්‍රවන්තයින් වෙත සම්ප්‍රේෂණය කිරීම පරමාර්ථය වේ. මෙය ක්‍රමිකව සෙමින් සිදුවන ක්‍රියාවලියක් වන අතර විශ්වවිද්‍යාල පුස්තකාල වෙත සහන මිලකට මේවා ලබා දීමට කටයුතු කිරීමට අපේක්ෂිතය.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

ආදායම වැඩිවීම

ශිෂ්‍ය ලියාපදිංචිය බලාපොරොත්තු වූ අගයට වඩා ඉහළ අගයක් ගෙන ඇත. හොංකොංහි Buddha Dhamma Center ආයතනය ද පාඨමාලා සඳහා එක් කර ගැනීම නිසා මෙසේ ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ ගොස් ඇත. ඒ අනුව අයවැයගත ආදායමට වඩා සත්‍ය ආදායම ඉහළ ගොස් ඇත.

වියදම් සම්බන්ධයෙන් ද අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස වර්ෂය තුළදී භාවිතා කර ඇති අතර, ඔබ විසින් සඳහන් කර ඇති පරිදි ප්‍රමාණාත්මක විචලනයන් පෙන්වා ඇත්තේ පාලනය කිරීමට අපහසු වූ වියදම් අයිතම කිපයක් සඳහා පමණි.

කෙසේ වුව ද ඉදිරියේ දී ද වියදම් සම්බන්ධයෙන් අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස උපරිම අයුරින් භාවිත කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ඇත.

## 6. පද්ධති හා පාලනයන්

(අ) ගබඩා පාලනය
ගබඩා ශේෂ වෙනස නිවැරදි කිරීම සඳහා අවශ්‍ය කටයුතු කර ගෙන යනු ඇත.

(ආ) ස්ථාවර වත්කම් පාලනය
ස්ථාවර වත්කම් ලේඛනයේ වෙනස හඳුනාගෙන ඇති අතර ඉදිරියේදී ඒ සඳහා අදාළ පාර්ශ්වයන් මගින් ලබා දෙන තීරණය අනුව ගිණුම් සටහන් තැබීමට නියමිතය.

(ඈ) පුස්තකාල පාලනය

2015 සිදු කරන ලද පුස්තකාල ග්‍රන්ථ සංගණනයේ සාරාංශගත තොරතුරු වාර්තාවක් 2016.09.30 දින කැලණිය විශ්වවිද්‍යාලයට යොමු කර ඇත.

ආපසු භාර නොදුන් කල් ඉකුත් වූ පොත් පැවතීම. - නිවැරදියි.

(ඈ) වාහන පාලනය

ආයතනයේ ඇති රාජකාරි කටයුතු සඳහා ප්‍රමාණවත් වාහන පහසුකම් නොමැත. WPNB 2659 වාහනය නිරන්තර රාජකාරි සඳහා සේවයේ යෙදෙයි. එම තත්වය මත වසරකට එක් වතාවක් පමණ ක් ඉන්ධන දහනය පරීක්ෂා කරන ලදී.

අංක 53-3103 දරන වාහනයේ එන්ජිම අලුත්වැඩියා තත්වයේ පැවතුනි.

ඉහත වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් සපයා ඇති පැහැදිලි කිරීම පිළිබඳව මම පෞද්ගලිකව ම වග වන බව මෙයින් සහතික කරමි.

මෙයට,

මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි,
අධ්‍යක්ෂ

පිටපත් : 01. ලේකම් - උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
02. ලේකම් - මුදල් අමාත්‍යාංශය
03. උපකුලපති - කැලණිය විශ්වවිද්‍යාලය
04. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

